| | |
|---|---|
| | **ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය** |
| | **අයදුම්පත් /නාමයෝජනා කැඳවීම** |

## උපකුලපති තනතුර

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ කවුන්සිලය, 1978 අංක 16 දරන පනතේ 34 වන වගන්තිය හා පසුව සිදු කරන ලද සංශෝධනය අනුව විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය සඳහා අයදුම්පත් හෝ නාමයෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකි. උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන අධ්‍යයන නිලධාරි සහ ගිණුම්කරණ නිලධාරියා විය හැකිය.ඔහු/ඇය හිටපු විධායක නිලධාරි සාමාජිකයෙකු සහ කවුන්සිලයේ සහ සෙනෙට් සභාවේ සභාපති ද විය හැකිය.

විශ්වවිද්‍යාල පනත 1978 අංක 16 වන සංශෝධනය පරිදි උපකුලපතිවරයා ඔහු/ඇය කලින් ධුරයෙන් ඉවත් වී හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස වසර තුනක කාලයක් හෝ ඔහු/ඇය ඔහුගේ/ඇයගේ හැටපස් වන වයස සම්පූර්ණ වන තුරු ධුරය දරයි.අධ්‍යයන නායකත්වය සැපයීම,කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය,හඳුන්වාදීම සහ මෙහෙය වීම,කවුන්සිලයේ ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම ඇතුළු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සඳහා උපකුලපතිවරයා වගකිව යුතු බැවින් අධ්‍යයන විශිෂ්ටත්වය,විනිවිදභාවය,වගකිව යුතුවීම,ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය,ඵලදායී හා පක්ෂග්‍රාහී නොවන නායකත්වය යන මූලධර්ම ඔහු/ඇය සතු විය යුතුය.

මෙම තනතුරට සුදුසු අපේක්ෂයන් හට ශක්තිමත් පර්යේෂණ පැතිකඩක් ,නායකත්ව ගුණාංගය,විවිධ උනන්දු දක්වන පුද්ගල කණ්ඩායම් සමඟ අන්තර් පුද්ගල සම්බන්ධකම් පැවත්වීමේ හැකියාව,ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීම ඇතුළු උසස් අධ්‍යාපන ජයග්‍රාහී ඉතිහාසයක් තිබිය විය යුතු වේ. විශ්වවිද්‍යාලයේ සාරධර්ම හා මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් හා ප්‍රජාව සඳහා කැපවීමක් ඔහු/ඇය සතුව පැවතිය යුතුය.( අයදුම්කරුවන් /නාමයෝජකයින් විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය http:/www.seu.ac.lk වෙත පිවිසිය හැකිය.)

උපකුලපතිවරයා ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයට සුදුසුකම් ලබා ඇති අතර වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් සහ තනතුරට අදාළ අනෙකුත් දීමනා සඳහා හිමිකම් ඇත.

පත්කිරීමේ ක්‍රියා පටිපාටිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2020 මැයි 04 දිනැති කොමිෂන් චක්‍රලේක අංක 02/2020 වෙත පිවිස ලබා ගත

හැකිය.(https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2198%3Acommission-circular-no-022020-appoinment-to-the-post-of-vice-%20chancellor&catid=176%3Acirculars-published-in-2020-012020-and-above&Itemid=20&lang=en )

අයදුම්කරුවන් / නාමයෝජනා ඉදිරිපත් කරන්නන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.

අයදුම්පත් / නාමයෝජනා සමග පහත සඳහන් ලියකියවිලි තිබිය යුතුය.

(I) උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ / නම් කරන ලද අයගේ සම්පූර්ණ කරන ලද ජීවදත්ත අකෘති පත්‍රය.

(II) විශ්ව විද්‍යාලයේ සංවර්ධනය පිළිබඳ පෞද්ගලික ප්‍රකාශයයක් සහ උපකුලපති තනතුරට පත් කළ හොත් ඔහු / ඇය සාක්ෂාත් කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.

(III)වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු හෝ මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය හෙබ වූයේ නම්, ඔහු / ඇය ඔහුගේ / ඇයගේ කාර්යාලයේ පළමු කාල සීමාව තුළ දී සිදුකරන ලද ජයග්‍රහණ ඉස්මතු කරන අයුරින් වාර්තාවක් ඉහත (II) වගන්තියේ සඳහන් කර ඇති ලේඛනවලට අමතරව ලබා දිය යුතුය.

(Iv) නාමයෝජනා සඳහා නම් කරන ලද තැනැත්තාගේ කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක්.

(v)ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය හැර අනිකත් රාජ්‍ය සේවා, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු / නාම යෝජනා ඉදිරිපත් කරන ලද අයෙකු නම්, ඔහු / ඇය උක්ත තනතුරට පත් කරන අවස්ථාවේදි නිදහස් කළ හැකි ද යන්න සඳහන් කරමින් සේවා යෝජකයාගේ ලිපියක්

චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව ලකුණු ලබාගත් අනුපිළිවෙළට නම් තුනක් ලැයිස්තුගත කිරීම සඳහා උපකුලපති ධුරය සඳහා සුදුසුකම් ලත් සියලු ම අපේක්ෂකයින් ඇගයීම් කමිටුවක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු අතර පසුව ලැයිස්තුගත කරනු ලැබූ අපේක්ෂකයින් අවම වශයෙන් විනාඩි දහයක (10) කට නො අඩු විනාඩි (15) නො වැඩි කාල සීමාවක් කෙටියෙන් ඉදිරිපත් කිරීම සඳහා එදින ම කැඳවනු ලැබේ. යම්කිසි සුවිශේෂී තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකු ඇගයීම් කමිටුවට / විශේෂ සභා රැස්වීමට පෙනී සිටීමට හැකියාවක් නොමැති නම්, ඔහුට / ඇයට වීඩියෝ සම්මන්ත්‍රණ මගින් පෙනී සිටීමට අවසරය ලැබේ.

ඉහත ඉල්ලීම් පරිදි අදාළ ලියකියවිලි සහිත අයදුම්පත් හා නාමයෝජනා එච්. අබ්දුල් සත්තාර්, ලේඛකාධිකාරි, අග්නිදිග විශ්වවිද්‍යාලය, ඔලුවිල් යන ලිපිනයට 09.02.2021 දින සවස 3.00 ට හෝ ඊට පෙර ඉහත කාර්යාලයට අතින් ගෙනත් භාර දී හෝ ලියාපදිංචි ලිපියක් මාර්ගයෙන් /කුරියර් මාර්ගයෙන් හෝ එවිය යුතුය. අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් / නාමයෝජනා කිසිසේත් භාරගනු නො ලැබේ.

අයදුම්පත / නාමයෝජනා අඩංගු ලියුම් කවරය එහි ඉහළ වම් කෙළවරේ "උපකුලපති කාර්යාලය" ලෙස සලකුණු කළ යුතුය.

**එච්. අබ්දුල් සත්තාර්**

**ලේඛකාධිකාරි හා කවුන්සිලයේ ලේකම්**

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**

**10.01.2021**